**සීමාසහිත ස්ටේට් ෆර්ටිලයිසර් සමාගමේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2025 මාර්තු 31 දිනෙන් අවසන් මාස නවය සඳහා.**

---

සීමාසහිත ස්ටේට් ෆර්ටිලයිසර් සමාගමේ 2025 මාර්තු 31 දිනෙන් අවසන් මාස නවය සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත මාස නවයක කාලපරිච්ඡේදයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

එම පනතේ 38(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**2. විගණන නිරීක්ෂණ**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් ඇතුළත් කරන ලද මුදල් රෙගුලාසි 877(2) ඇ සහ 2021 නොවැම්බර් 16 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතෙහි ඡේද අංක 6.6 පරිදි ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව සමඟ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2024/2025 මූල්‍ය වර්ෂයට අදාළව 2025 මාර්තු 31 දිනට ඉදිරිපත් කළ යුතු මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව මෙම වාර්තාවේ දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මෙම කාලසීමාව තුල සමාගම් ඒකාබද්ධ වීම හේතුවෙන් සමාගම් දෙකෙහිම මූල්‍ය වාර්තා 04 ක් (2024 මාර්තු 31 හා 2024 ජුනි 30) පිළියෙල කිරීමට සිදුවීමත් නව මෘදුකාංග පද්ධතියක් සමාගමෙහි කාර්යන් සඳහා සුදුසු පරිදි සංවර්ධනය කර ස්ථාපනය කිරීම හා ඊට ශේෂයන් ඇතුලත් කිරීමට සිදුවීම වැනි කාර්යයන් හේතුවෙන් 2025 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ප්‍රමාදවී ඇති අතර කඩිනමින් එම මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කළ යුතුය. |

## 2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම

සීමා සහිත ලංකා පොහොර සමාගම හා සීමා සහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ඒකාබද්ධ කර 2024 ජූලි 01 දින සිට ඒකාබද්ධිත සමාගම 2024 ජූලි 24 දින සීමාසහිත ස්ටේට් ෆර්ටිලයිසර් සමාගම ලෙස සංස්ථාගත කර තිබුණි. පෙර පැවති උක්ත සමාගම් දෙක විසින් 2024 ජුනි 30 දිනට පිළියෙල කල අවසන් මාස තුනක කාලච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, හිමිකම්, ආදායම් හා වියදම් පිළිබඳ අගයන් සහ සමාගම විසින් 2023 දෙසැම්බර් 15 දිනැති වත්කම් තක්සේරුකරණ වාර්තාවේ ඇතුළත් අගයන් පිළිබඳව සලකා බැලීමෙන් පසු නව සමාගමේ මූල්‍ය ප්‍රකාශන වලට එම අගයන් ජ'නල් සටහන් මගින් ඇතුළත්කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | සීමා සහිත ලංකා පොහොර සමාගම | සීමා සහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | සීමා සහිත ස්ටේට් ෆර්ටිලයිසර් සමාගම 2024 ජූලි 01 දිනට |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ජංගම නොවන වත්කම් | 5,749,924,251 | 911,973,349 | 6,661,897,600 |
| ජංගම වත්කම් | 19,012,684,672 | 14,985,392,515 | 33,998,877,187 |
| මුළු වත්කම් | 24,762,608,923 | 15,897,365,864 | 40,659,974,787 |
| හිමිකම් | 8,865,407,018 | 4,188,877,729 | 13,054,284,747 |
| ජංගම නොවන වගකීම් | 9,754,930,014 | 5,029,084,779 | 14,784,014,793 |
| ජංගම වගකීම් | 6,142,271,889 | 6,679,403,356 | 12,821,675,245 |
| මුළු හිමිකම් හා වගකීම් | 24,762,608,923 | 15,897,365,865 | 40,659,974,788 |
| ආදායම් | 393,982,490 | 323,156,818 | 717,139,308 |
| වියදම් | 869,518,812 | 396,187,539 | 1,265,706,351 |
| බදු පසු ලාභය / අලාභය | (475,536,322) | (73,030,721) | (548,567,043) |

## 2.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෙර පැවති සීමා සහිත ලංකා පොහොර සමාගම් පරිශ්‍රයේ පිහිටි අංක 07 ගබඩාවේ පැවති මෙ.ටොන් 4,350 MOP පොහොර තොගය නැවත මළුගත කිරීමේ කාර්යයේදී සමාගමේ බෙදාහැරීම් කළමණාකරුගේ වාර්තාව හා යන්ත්‍ර සැපයුම්කරුගේ වාර්තාවට අනුව නැවත මළු කරන ලද පොහොර ප්‍රමාණය පිළිවෙලින් මෙ.ටොන් 4,349.3 ක් හා මෙ.ටොන් 4,324.5 ක් වීම හේතුවෙන් පොහොර මෙ.ටොන් 24.8 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, 2022 වර්ෂයේ දෙසැම්බර් මාසයේ සිට මේ දක්වා එම ගබඩාවේ ඇති MOP පොහොර තොගය ගණනය කළ නොහැකි ලෙස අසුරා තිබීම හේතුවෙන් අදාළ පොහොර තොගය භෞතිකව සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මෙම ගබඩාවේ තොග රැස්කිරීමට අනුව සමස්ථ එම්.ඕ.පී. තොගය අට්ටි වශයෙන් කොටස් 07කට වෙන්කර තිබූ අතර, ඉන් කොටස් 05ක පොහොර තොගය ගණන් කල හැකිව තිබූ අතර, කොටස් 02ක් ගණන් කළ නොහැකි මට්ටමක පැවතුණි. කෙසේ වෙතත් මෙම ගණන් කළ නොහැකි තොගය යන්ත්‍රානුසාරයෙන් නැවත මළු කිරීමේ කටයුතු සඳහා යොදවන ලදී. | වෙනසට හේතු හඳුනාගෙන නිවැරදි කිරීම් සිදු කළ යුතුය. |

## 2.4 ලැබිය යුතු ශේෂ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 401 ක් වෙතින් සමාගමට අයවිය යුතු මුළු වටිනාකම රු.262,300,789 ක් වූ අතර ඉන් ගොවිජන සේවා මධ්‍යස්ථාන 23 කින් අයවිය යුතු එකතු වටිනාකම රු.4,590,340 ක් වර්ෂ 5 ඉක්ම වූ ශේෂයන් විය. කෙසේ වෙතත් ගොවිජන සේවා මධ්‍යස්ථාන 12 කට අදාළව ලබාගත් ශේෂ සනාථන ලිපි අනුව ශේෂය රු.9,373,358 ක් වූ අතර සමාගමේ ලේඛන අනුව එම ශේෂය රු.9,562,187 ක් වීම හේතුවෙන් රු.188,829 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙහි සඳහන් රු.262,300,789 ක් වූ ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙතින් අයවිය යුතු මුදලින් රු.4,590,340ක් වූ මුදල 2006 වසරේ සිට ණයට ලබා දුන් පොහොර වෙනුවෙන් අයවිය යුතුව පවතින මුදලකි. මෙම මුදල ගොවිජන සේවා මධ්‍යස්ථාන 23 කින් ලැබීමට ඇති අතර ඔවුන් විසින් ශේෂ සනාථ කිරීමේ ලිපිද එවා ඇත. එසේම මෙහි සඳහන් ගොවිජන සේවා මධ්‍යස්ථාන 12 ක ශේෂ සනාථ කිරීම් ලිපි වල සඳහන් වටිනාකම සහ අප සමාගමේ සඳහන් වටිනාකම අතර රු.188,829ක වෙනසක් පැවතීමට විවිධ හේතු බලපා තිබිය හැක. වසර 10ට වඩා අඩු කාලසීමාවක් තුල ගොවිජන සේවා මධ්‍යස්ථාන වලින් අයවීමට ඇති ණය, අයකර ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමුකර ඇත. එසේම ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ගද ගෙන ඇත. | අයවිය යුතු ණයගැති ශේෂ තහවුරු කර අදාල අයකර ගැනීම් නොපමාව සිදුකළ යුතුය. |
| (ආ) | වර්ෂ 05 ඉක්මවූ බෙදාහරින්නන් තිදෙනෙකුගෙන් (Distributors) අයවිය යුතු රු.42,952,277 ක ණයගැති ශේෂයක්ද,විවිධ සේවා සමූපකාර 07 කින් අයවිය යුතු රු.993,423 ක ණයගැති ශේෂයක් හා පෞද්ගලික ණයගැතියන්ගෙන් අයවිය යුතු රු.65,442,258 ක ණයගැති ශේෂයන් පැවති අතර මෙම වාර්තාවේ දින වන විටත් උක්ත ශේෂයන්හි නිරවද්‍යතාවය තහවුරුකර ගැනීමට සහ එම ශේෂ නිරවුල් කිරීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි. | වසර 5 ඉක්මවූ බෙදාහරින්නන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.42,952,277 ක ණයගැති ශේෂය අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගෙන ඇත. එසේම විවිධ සේවා සමූපකාර 7කින් ලැබිය යුතු රු.993,423 ක මුදල 1994 වසරට පෙර සිට පැවත එන ණයගැති ශේෂ බැවින් හා ඊට අදාල ලිපිගොනු හෝ තොරතුරු සොයාගත නොහැකි බැවින් ගිණුම්වලින් ලියාහැරිමට ඉල්ලීම් යොමු කිරිමට ඉදිරියේදී කටයුතු කරනුලැබේ.පෞද්ගලික ණය ගැතියන්ගෙන් අයවිය යුතු රු.65,442,258 ක මුදල මුදල 2016/17 වර්ෂ වලදී විවෘත වෙළඳපොල තුල ණයට ලබාදුන් පොහොර වෙනුවෙන් අයවීමට ඇති මුදල් වේ. මෙම මුදල් අයකර ගැනිම සඳහා ණයගැතියන් කිහිප දෙනෙකුට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | අයවිය යුතු ණයගැති ශේෂ තහවුරු කර අදාල අයකර ගැනීම් නොපමාව සිදුකළ යුතුය. |
| (ඇ) | ණය පදනම මත පොහොර ලබාදීම වෙනුවෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් අයවිය යුතු රු.37,833,346 ක්ද, අම්පාර අන්තර් පළාත් කෘෂිකර්ම කාර්යාලයෙන් අයවිය යුතු රු.12,543,845 ක්ද, රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් අයවිය යුතු රු.35,931,679 ක්ද, පොල් වගාකිරීමේ | ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් හා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් ණය පදනම මත ලබාදුන් පොහොර වෙනුවෙන් අයවිය යුතු මුදල් සම්බන්ධයෙන්, 2025 වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ මැදිහත්වීමෙන්, විසඳුම් ලබා ගැනීම පිණිස ලිපියක් යොමුකර ඇත. | අයවිය යුතු ණයගැති ශේෂ තහවුරු කර අදාල අයකර ගැනීම් නොපමාව සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මණ්ඩලයෙන් අයවිය යුතු රු.6,007,018 ක්ද,පැල්වත්ත සීනි සමාගමෙන් අයවිය යුතු රු.807,650 ක්ද, ඉබ්බාගමුව වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයෙන් අයවිය යුතු රු.120,500 ක්ද පනාගොඩ යුධ හමුදා මූලස්ථානයෙන් අයවිය යුතු රු.11,500 ක්ද, වශයෙන් වර්ෂ 05කට වැඩි කාලයක සිට පැවත එන රු.93,255,538 ක ණයගැති ශේෂ අයකර ගැනීමට සමාගම තවදුරටත් අපොහොසත් වී තිබුණි. | අම්පාර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂක විසින් ණය මුදල් නොගෙවීම සම්බන්ධයෙන් අපරාධ පරික්ෂණ දෙපාර්ථමේන්තුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. එහි ප්‍රගතිය විමසා 2023.07.10 දින හා 2024.02.06 දින, අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමුකර ඇත. එමෙන්ම මේ වන විට සක්‍රීය තත්වයේ පවතින ගොවි සංවිධාන වල තොරතුරු ලබාගෙන විමර්ෂණ කටයුතු සිදුකරමින් පවතින බව අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත. එසේම පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත 2023 වර්ෂයේ ණයට ලබාදුන් පොහොර වෙනුවෙන් අයවීමට ඇති මුදල් අයකර ගැනීමට අවශ්‍යය කටයුතු සිදු කරනු ලැබේ. තවද පැල්වත්ත සීනි සමාගමෙන් අයවීමට ඇති ණය මුදල පිළිබදව පරික්ෂාකර ඇති අතර අදාල ලේඛණ හා තොරතුරු තවදුරටත් සොයා බැලීමට තීරණය කර ඇත.<br>එසේම ඉබ්බාගමුව වී පරික්ෂණ හා සංවර්ධන ආයතනයෙන්ද පනාගොඩ යුද හමුදා මූලස්ථානයෙන්ද අයවිය යුතුව ඇති රු.132,500ක මුදල කෘෂිකර්ම අමාත්‍යංශයය මඟින් කරන ලද අනුමැතීන් මත ණයට ලබාදුන් පොහොර වලට අදාල මුදල් වන අතර 2025/26 බැදීම් බැරකම් මඟින්ද මෙම මුදල් කෘෂිකර්ම අමාත්‍යංශය මඟින් ඉල්ලුම් කරමින් ලිපි ඉදිරිපත් කර ඇත. | |

## 2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම් ඒකාබද්ධ කිරීමෙන් පසුව පැරණි සමාගම් නමින් පවත්වාගෙන ගිය බැංකු ගිණුම් 05 ක් වසා දැමීමට හා ඉතිරි බැංකු ගිණුම් 06 ක් නව සමාගම නමින් ඉදිරියට රැගෙන යාම සඳහා සමාගම් ඒකාබද්ධ කිරීමෙන් මාස 06 කට පසුව එනම් 2025 ජනවාරි 22 දින අධ්‍යක්ෂක මණ්ඩලය තීරණයකර තිබුණද සමාගම් ඒකාබද්ධ කිරීමෙන් වර්ෂයකට අධික කාලයක් ගතවී මෙම වාර්තාවේ දිනය වන විටත් එම බැංකු ගිණුම් වසා දැමීම සිදුකර නොතිබුණි. | ඉහත බැංකු ගිණුම් වසා දැමීමට 2025.01.22 දිනැති අධ්‍යක්ෂක මණ්ඩල තීරණය ලබා දී තිබුණද බැංකු ගිණුම් වසා දැමීම සඳහා බැංකු වෙත අධ්‍යක්ෂක මණ්ඩල තීරණයද සමඟ form 20 පත්රිකාව ඉදිරිපත් කල යුතුය. අධ්‍යක්ෂක මණ්ඩල විස්තර ඇතුලත් form 20 පත්‍රිකාව සමාගම් රෙජිස්ටාර් කාර්යාලයෙන් අප වෙත ලබාදීමට ප්‍රමාද වූ බැවින් ඒ සඳහා මහාභාණ්ඩාගාර නියෝජිත අධ්‍යක්ෂකවරයා මාරු විමද බලපා ඇත. කෙසේ වෙතත් එම බැංකු ගිණුම් වසා දැමීමට අවශ්‍ය ලිපි මහජන බැංකුව වෙත මේ වන විට ලබා දී ඇත. | අධ්‍යක්ෂක මණ්ඩල තීරණ පරිදි අදාළ බැංකු ගිණුම් වසා දැමීම සිදුකර එම මුදල් නිවැරදිව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ඒකාබද්ධ කිරීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ 241 (1 ආ) වගන්තිය පරිදි සමාගම ඒකාබද්ධ කිරීම බලාත්මක වීමෙන් ඉක්බිතිව ඒකාබද්ධිත සමාගමේ මූල්‍ය ස්ථායිත්වය පිළිබඳ පරීක්ෂණයෙන් (Solvency Test) සමත් වන බවට අධ්‍යක්ෂක මණ්ඩලය සෑහීමට පත්වන බවට යෝජනා ස්ථිර කර තිබුණද, සමාගමේ කළමණාකාරීත්වය විසින් මෙම වාර්තාවේ දින වන විටත් එම මූල්‍ය ස්ථායිත්වය පිළිබඳ පරීක්ෂණය සිදු කර නොතිබුණි. කෙසේ වෙතත් සී/ස ලංකා පොහොර සමාගම හා සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම පිළිවෙළින් බදු පසු ලාභයෙන් රු.21,161,837 ක් හා රු.43,913,037 ක් 2025 මාර්තු 25 දින ලාභාංශ වශයෙන් මහා භාණ්ඩාගාරයට ගෙවීම් කර තිබුණි. | ඒකාබද්ධිත සමාගමෙහි මූල්‍ය ස්ථායිතාවය පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා 2024.07.0 1 දිනට ඒකාබද්ධිත ගිණුම් පිළියෙළ කළ යුතුව ඇත. එම ගිණුම් පිළියෙළ කිරීම සඳහා කොළඹ කොමර්ෂල් පොහොර සමාගමෙහි සහ ලංකා පොහොර සමාගමෙහි 2024.06.30 දිනට ගිණුම් (මාස තුනක් සඳහා) පිළියෙළ කර විගණනය සඳහා ඉදිරිපත් කළ අතර, ගිණුම් වැරදි නිවැරදි කිරීම් සඳහා විගණනය අවසන් කළ ගිණුම් ,අප වෙත ලබාදී ඇත. ඒ අනුව එසේ අප වෙත ලබා දුන් ගිණුම්වල ගැලපීම් කිරීම් මේ වන විට සිදුවෙමින් පවතින අතර ගැලපුම් සහිත ඒකාබද්ධිත අවසාන ගිණුම් විගණනය හා මූල්‍ය ස්ථායිතාවය පිළිබඳ පරීක්ෂණය සඳහා කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව ප්‍රකාරව මූල්‍ය ස්ථායිතාවය පිළිබඳ පරීක්ෂණය සිදු කළ යුතුය. |

### 3.2 අනාර්ථික ගණුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.මිලියන 5.1 වියදමක් දරමින් වැඩිදියුණුකර නව සමාගම තුළ ස්ථාපිත කරන ලද ERP පද්ධතිය හා මානව සම්පත් කළමණාකරණ තොරතුරු පද්ධතිය (HIRIS) ට අමතරව සමාගමේ සේවකයින්ගේ කාර්ය සාධනය ඇගයීම වඩා විධිමත් කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් විසින් සංවර්ධනය කර ඇති Employee Performance Evaluation Module මිලදී ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 37 මඟින් අනුමැතිය ලබා දී තිබුණි.මෙම H2504 නම් වූ කාර්යසාධන කළමණාකරණ පද්ධතිය ස්ථාපනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා රු.550,000 ක් හා වාර්ෂික නඩත්තු කිරීම් සඳහා 2025 ජනවාරි 01 දින සිට වර්ෂ 05 ක කාලයක් සඳහා වර්ෂයකට රු.350,000 බැගින් ගෙවීම් කිරීමට ගිවිසුම්ගතව තිබුණු අතර ERP පද්ධතිය | සමාගම් ඒකාබද්ධ කිරීමෙන් අනතුරුව සී/ස ලංකා පොහොර සමාගමේ පැවති මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතිය ඒ ආකාරයෙන්ම තවදුරටත් පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව Victory information (PVT) Ltd ආයතනය සමඟ ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව රු.350,000 ක වාර්ෂිකව නඩත්තු ගාස්තුවක් (Annual Maintenance Charge) යටතේ එම පද්ධතිය පවත්වාගෙන යනු ලැබේ.<br>ඉන් අණතුරුව දැනට පවතින සේවක කාර්යය සාධන ඇගයීම් ක්‍රමවේදය වෙනුවට මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතිය හරහා ක්‍රියාත්මක කලහැකි කාර්යයසාධන ඇගයුම් පද්ධතියක් වැඩිදියුණු කිරීමට කළමනාකාරීත්වය තීරණය කරන ලදී. ඒ අනුව එම ආයතනය විසින් එම කාර්යය සාධන ඇගයුම් මොඩියුලය (Performance Management Module) ස්ථාපිත කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා එක්වරක් පමණක් | සේවක කාර්යසාධන ඇගයීමේ මොඩියුලය නිර්මාණය කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වැඩිදියුණු කරන අවස්ථාවේදී සේවක කාර්යසාධනය මැනීම සඳහා එම පද්ධතිය තුළම ක්‍රමවේදයක් සකසා ගැනීමකින් තොරව රු.මිලියන 2.3 ක අමතර පිරිවැයක් දරා ඒ සඳහා වෙනම මෘදුකාංගයක් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. කෙසේ වෙතත් මෙම සේවක කාර්යසාධන ඇගයීමේ මොඩියුලය නිර්මාණය කිරීමේ කටයුතු සඳහා ඇස්තුමේන්තු වටිනාකමින් සියයට 30 ක්, එනම් රු.165,000 ක් ගෙවා තිබුණද, එම කාර්යය විගණිත දිනය දක්වා සම්පූර්ණ කර නොතිබුණි. | ගෙවීම් කරනු ලබන රු.550,000 ක් අදියර තුනක් යටතේ ගෙවීම් කිරීමට ගිවිසුම්ගතවී ඇත. එහිදී එම පද්ධතිය අප සමාගමේ පරිගණක පද්ධතිය වෙත ස්ථාපිත කිරීමෙන් අනතුරුව සම්පූර්ණ ගාස්තුවෙන් සියයට 30 ක් ගෙවීම් කිරීමට කටයුතු කර ඇත. | |
| (ආ) | සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමට ගබඩාවක් ඉදිකිරීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශ ලේකම්ගේ 2015 ඔක්තෝබර් 27 දිනැති හා අංක MDE/L/03/W/12 ලිපිය මඟින් දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදී ඇති ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් හම්බන්තොට පිහිටි ඉඩමේ ගබඩාවක් ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේ රු.3,722,901ක ප්‍රාරම්භක වියදමක් දරා තිබුණද, මේ දක්වා කිසිදු ඉදිකිරීමක් සිදුකර හෝ මහවැලි අධිකාරිය වෙත නැවත පවරාදීමට හෝ කටයුතුකර නොතිබුණි. | රජයේ සහනාධාර පොහොර බෙදා හැරීමේ වැඩසටහන යටතේ හම්බන්තොට වරාය උපයෝගී කරගෙන හම්බන්තොට, බදුල්ල, මොණරාගල හා අම්පාර දිස්ත්‍රික්ක සඳහා කඩිනමින් පොහොර බෙදා හැරීමේ අරමුණ ඇතිව විගණන විමසුමෙහි සඳහන් ගබඩාව ඉදිකිරීමට කටයුතු කළද පසුව සහනාධාර ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමත් සමගම එම ප්‍රදේශයෙහි ගබඩාවක අවශ්‍යතාවය නොමැති විය. මේ වනවිට අදාළ ඉඩමද මහවැලි අධිකාරිය වෙත නැවත ලබාදීමට කටයුතු කර ඇත. | ඉඩම පවරාදීමේ කටයුතු කඩිනමින් අවසන්කළ යුතුය. |
| (ඇ) | 2024 ජුනි 30 දිනට සමාගම් දෙක විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන තුළ රු.548,567,043 ක බදු පසු අලාභයක් පැවතියද සමාගම් ඒකාබද්ධ කර නව සමාගමෙහි ව්‍යාපාර එළිදැක්වීමේ කටයුතු 2024 ජුලි 11 දින බත්තරමුල්ල වෝටර්ස් ඒජ් හෝටල් පරිශ්‍රයේදී උත්කර්ශවත් අයුරින් පවත්වා තිබුණු අතර ඒ සඳහා රු.36,835,731 ක වියදමක් දරා තිබුණි. කෙසේ වෙතත් අදාල ව්‍යාපාර එළිදැක්වීම තුළින් නව සමාගම විසින් ලබාගෙන තිබුණු නව ව්‍යාපාරික අවස්ථාවන් විගණනයට නිරීක්ෂණය නොවීය. | විගණන විමසුම මගින් දක්වා ඇති පරිදි 2024 ජුනි 30 දිනට බදුපසු අලාභයක් ලෙස රු.548,567,043 ක් ලෙස දැක්වුවද ඊට හේතු වී ඇත්තේ අනිවාර්ය විශ්‍රාම වන්දි ක්‍රමය යටතේ සේවකයින් වෙත ගෙවීම් සිදුකිරීමයි. සමාගම් එළිදැක්වීමේ කටයුතු සඳහා රු.36,835,731 ක මුදලක් Waters Edge හෝටල් පරිශ්‍රයෙහි උත්සවය සඳහා දැරූ බව සඳහන් කළද, එම හෝටල් පරිශ්‍රය හා ආහාරපාන සඳහා රු.3,431,912 ද සංවිධානය හා කළමනාකරණය කටයුතු සිදුකළ Selacine Media Solutions ආයතනයේ ගාස්තු ලෙස රු.13,365,801ක් එම සම්පූර්ණ උත්සවය සඳහා රු.16,797,713 ක මුදලක් දරා ඇත. අනෙක් සියලු වියදම් දරා ඇත්තේ නව ව්‍යාපාර නාමය සඳහා පුළුල් ප්‍රචාරයක් ලබාදීම අරමුණු කරගෙන විද්‍යුත් හා මුද්‍රණ මාධ්‍ය හරහා ප්‍රචාරණය සඳහා වේ. | අනාර්ථික වියදම් අවම කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමණාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලංකා පොහොර සමාගම් පරිශ්‍රයේ කාර්යාල වෙන්කිරීම (Partition) සඳහා රු.3,782,000 ක පිරිවැයකට පෞද්ගලික සමාගමකට කොන්ත්‍රාත්තුව පිරිනමා අදාල නවීකරණ කටයුතු සිදුකරගෙන යන අතරතුර 2025 ජුනි 20, 2025 ජුලි 21 සහ 2025 අගෝස්තු 01 යන තෙදින පවත්වන ලද ප්‍රසම්පාදන කමිටු රැස්වීම්වලදී නවීකරණ කටයුතු සම්බන්ධව නව යෝජනා 19 ක් ඉදිරිපත් වී තිබුණි. කාර්යාල වෙන්කිරීම (Partition) හා දොරවල් යෙදීම සඳහා මූලික ඇස්තමේන්තු වෙනස් කරමින් දැනට කාර්යය පවරා ඇති කොන්ත්‍රාත්කරු වෙතද එම කාර්යයම වෙනත් අංශවල සිදුකිරීම සඳහා නව කොන්ත්‍රාත්කරුවෙකුද වර්ණ ආලේප කිරීම, කාපට් යෙදීම, වයරින් කිරිම හා ජාලකරණය කිරීම සඳහා නව කොන්ත්‍රාත්කරුවන් පත්කර ගැනීමට උක්ත රැස්වීම්වලදී තීරණය කර තිබුණි. මෙලෙස විධිමත් සැලසුමකින් තොරව වරින්වර කළමණාකාරීත්වය ගනුලබන තීරණ මගින් සමාගමට අනවශ්‍ය පිරිවැයක් හා කාලයක් වැයකිරීමට සිදුව ඇති බව විගණනයට නිරීක්ෂණය විය. | කාර්යාල වෙන්කිරීමේ කටයුතු සඳහා ලංසු කැඳවීමේ දී මූලික අවස්ථාවේ සිට කාර්ය පදනම් කරගෙන(Partition) පිළියෙල කරන ලද පිරිවිතර මත ලංසු කරුවන්ට ලංසු ප්‍රධානය කරන ලදී. ඒ අනුව අංශවල සංශෝධනයන් සිදුවන අවස්ථාවන්හිදී වෙනම කාර්යයක් ලෙස කොන්ත්‍රාත් කරුවන් පත් කර ගෙන ඇත.<br>විගණන විමසුම මගින් දක්වා ඇති කාර්යයන් එකිනෙක වෙනස් කාර්යයන් වන අතර පෙන්වා දී ඇති සියළුම කාර්යයන් සිදු කරනු ලබන කොන්ත්‍රාත්කරුවන් සොයා ගැනීම අපහසුවේ. නවීකරණ කටයුතු සඳහා පත්කරන ලද කමිටුව විසින් නිරීක්ෂණය කරන ලද පරිදි එකිනෙකට වෙන් වූ කාර්යයන් ඊට මනා නිපුණතාවයක් දරන කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම වඩා පිරිවැය ඵලදායී බව පෙනී ගොස් ඇති බැවින් වෙන වෙනම ප්‍රසම්පාදන කටයුතු සිදුකර ඇත. | පූර්ව අධ්‍යනයකින් නවීකරනයන් සිදුකල යුතුය. |
| (ආ) | විගණනය වෙත ඉදිරිපත්කරන ලද ඒකාබද්ධිත සමාගමේ සංයුක්ත සැලැස්මෙහි ඇතුළත් 2024/2025 මුල්‍ය වර්ෂයට අදාළ මූලධන අයවැය ඇස්තමේන්තුව අනුව පොහොර මිශ්‍ර කිරීමේ යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා රු.100,000,000 ක් ඇස්තමේන්තුකර ඇතත් මූල්‍ය වර්ෂය අවසන් වන තෙක් එවැනි යන්ත්‍රයක් මිලදී ගෙන නොතිබුණි. පසුව 2025/2026 මූල්‍ය වර්ෂ අයවැය මගින්ද එහි ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම වෙනුවෙන් ප්‍රසම්පාදන හා තාක්ෂණික කමිටු පත්කර තිබුණද, ප්‍රසම්පාදනයට අදාළ ලංසු ලේඛන සකස් කර අවසන් කිරීම මෙම වාර්තාව නිකුත් කරන දිනය වන තෙක් සිදුකර නොතිබුණි. පෙර පැවති සමාගම් විසින් දීර්ඝ කාලයක සිට විශාල පිරිවැයක් දරමින් මිනිස් ශ්‍රමය භාවිතාකර පොහොර මිශ්‍ර කිරීමේ කටයුතු සිදුකළ අතර එම සමාගම් ඒකාබද්ධ වීමෙන් පසුවද පොහොර මිශ්‍ර කිරීමේ කාර්යය වෙනුවෙන් මාස නමයක කාලච්ඡේදයක් සඳහා ආසන්න වශයෙන් රු.22,350,331 ක් දරා තිබුණි. තරගකාරී විවෘත වෙළඳපොළ තුළ විකුණුම් | රජයේ සමාගම් ඒකාබද්ධ වීමෙන් පසු 2025/26 මූල්‍ය වර්ෂය සඳහා රු.මිලියන 125 ක මුදලක් මිශ්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ඇස්තමේන්තු කළ අතර පොහොර සඳහා වන විවෘත වෙළඳපොළ තුළ මිශ්‍ර පොහොර අලෙවිය වර්ධනයට එය ඉවහල් වන බව කළමනාකාරිත්වයේ අපේක්ෂාව වේ. මේ වන විට මිශ්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක වන අතර විගණන විමසුමෙන් දක්වා ඇති ආකාරයට එමඟින් රු.මිලියන 22කින් විකුණුම් පිරිවැය අඩු කළ නොහැකි වන්නේ යන්ත්‍රය භාවිතා කළද මිශ්‍රණ ක්‍රියාවලිය සඳහා තවදුරටත් මිනිස් ශ්‍රමය හා විදුලිය අවශ්‍ය වන බව පෙන්වා දෙනු කැමැත්තෙමි. | අයවැය ඇස්තමේන්තුව අනුව ප්‍රසම්පාදන කටයුතු නිශ්චිත කාලවකවානු තුළ සිදුකල යුතුය. |

කටයුතු පුළුල්කර ගැනීමට මෙම යන්ත්‍රය මිලට ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමණාකාරීත්වයේ අවධානය යොමුකර නොතිබුණි.

## 3.4 කළමණාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ ඒකාබද්ධ කිරීමෙන් පසුව ස්ථාවර වත්කම් සත්‍යාපනය, කේත කිරීම, ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීම හා අතිරික්ත ස්ථාවර වත්කම් හඳුනාගැනීම සඳහා සුදුසු විශේෂඥ ආයතනයක් තෝරා ගැනීම වෙනුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලය 2025 ජනවාරි 21 දින අනුමත කර ඒ සඳහා ලංසු කැඳවීමේ කටයුතු 2025 මාර්තු 18 දින පුවත්පත් දැන්වීමක් මඟින් සිදුකර තිබුණි. ඒ අනුව 2025 ජුනි 30 හා 2025 ජූලි 29 දින ලංසු ඇගයීම් සිදුකර ලංසු පිරිනැමීම සඳහා ආයතනයක් තෝරාගැනීම පමණක් සිදුකර තිබුණි. සමාගම් දෙක ඒකාබද්ධ වී වර්ෂයක කාලයක් ගතවී තිබුණද 2021 නොවැම්බර් 16 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතෙහි ඡේද අංක 6.7 ප්‍රකාරව අදාළ ස්ථාවර වත්කම් සත්‍යාපනයකර සමාගමේ පවතින ඌන උපයෝජිත ස්ථාවර වත්කම් හඳුනාගැනීමට කටයුතුකර නොතිබුණි. | රාජ්‍ය පොහොර සමාගම් 2 ඒකාබද්ධ කිරීම 2024 ජූලි 01 වන දිනට ක්‍රියාත්මක වන පරිදි ඒකාබද්ධ වූ නමුත් එම ක්‍රියාවලියේ කටයුතු රාශියක් තවදුරටත් එදිනෙන් පසු කළ යුතුව තිබුණි.<br>තවද, මූල්‍ය අංශය විසින් ඍජුවම දායක විය යුතු කටයුතු රාශියක්ද පසුගිය කාල සීමාව තුල සිදුකිරීමට සිදුවිය.<br>එදිනෙදා කටයුතු පවත්වාගෙන යමින් 8,000 ට අධික ස්ථාවර වත්කම් ප්‍රමාණයක් සත්‍යාපනය කිරීමේ කටයුතු සඳහා ප්‍රමාණවත් සේවක පිරිසක් නොමැති බැවින් ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව ස්වාධීන ආයතනයක් තෝරා තෝරාපත් කර ගැනිම වඩාත් සුදුසු බැවින් එවැනි ආයතනයක් තෝරා ගැනීම සඳහා 2025 ජනවාරි 21 දින අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව තෝරා ගත් KPMG ආයතනය පසුව කොන්ත්‍රාත්තුවෙන් ඉවත් වූ බැවින් දෙවනුව සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද ලංසුකරු වන E&Y ආයතනය තෝරා පත්කර ගන්නා ලද අතර මේ වන විට එම ආයතනය සමඟ ඒකාබද්ධව ස්ථාවර වත්කම් සත්‍යාපනය කිරීම හා අනෙකුත් කටයුතු සිදු කරනු ලබයි. | නව සමාගමේ ස්ථාවර වත්කම් සත්‍යාපනය කඩිනමින් සිදුකළ යුතුය. |
| (ආ) | පරිසර හිතකාමී දේශීය පොහොර මිලදී ගැනීමේ ව්‍යාපෘතිය යටතේ 2021/2022 වර්ෂයේ මිලට ගෙන නොවිකිණී ඉතිරිව පවතින කාබනික පොහොර අම්පාර, හොරොව්පතාන,මැදවච්චිය, නොච්චියාගම, බදුල්ල, මඩකලපුව,දෙහිගහලන්ද, කොණ්ඩාවිල්, හිඟුරක්ගොඩ හා ඇඹිලිපිටිය ප්‍රාදේශීය ගබඩාවන් වල වැඩි වශයෙන් පවතින බව 2025 මාර්තු මාසයේ පැවැත්වූ වාර්ෂික තොග සත්‍යාපනයේදී නිරීක්ෂණය විය. 2025 මැයි 08 දිනට මෙසේ අලෙවි | මේ සම්බන්ධයෙන් අවස්ථා ගණනාවකදීම විගණන හා කළමනාකරණ රැස්වීම්වලදී සාකච්ඡා කළ අතර එහිදී ලබා දුන් නිර්දේශ හා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය යටතේ එම කාබනික පොහොර රජයේ ආයතන වලට ලබාදීමට කටයුතු සිදු කරමින් පවතී. | ඉතිරිව පවතින කොම්පෝස්ට් පොහොර ප්‍රමාණය සම්බන්ධව ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නිෂ්කාර්යය පිරිවැය අවම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොවී ඉතිරිව පවතින කොම්පෝස්ට් පොහොර ප්‍රමාණය මෙ.ටොන් 2,487 ක් වන අතර එහි වටිනාකම රු.32,835,355 කි. එසේ වුවද විගණිත දිනය වන විටත් මෙම පොහොර සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. | | |
| (ඇ) | මෙම වාර්තාවේ දින වන විටත් ගොවීන් වෙත බෙද හැරීම සිදු නොකළ 2023 දෙසැම්බර් මස 20 දින වන විට කල් ඉකුත් වී ඇති වටිනාකම රු.5,095,300 ක් වූ මි.ලිටර 500 දියර පොහොර බෝතල් 1,201 ක් සමාගමේ ගබඩාවල පැවතියද මේ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම නැනෝ නයිට්‍රජන් බෝතල් බෙදා හැරීම ජාතික පොහොර ලේකම් කාර්යාලයේ නිර්දේශය අනුව සිදු කරන ලදී .විගණන විමසුමෙහි සඳහන් බෝතල් ප්‍රමාණය සඳහා නිර්දේශයක් හෝ ඒ සඳහා ඉල්ලුමක් නොමැති වීමෙන් ගබඩා තුළ ඉතිරි වී ඇත .මෙම ඉතිරි වූ බෝතල් සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව විමසා අප විසින් කෘෂිකර්ම අමාත්‍යාංශය ලේකම් වෙත ලිපි යොමු කර ඇත. | අදාළ දියර පොහොර ප්‍රමාණය සම්බන්ධව ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නිෂ්කාර්යය පිරිවැය අවම කළ යුතුය. |
| (ඈ) | නව සමාගම ස්ථාපනයකර වර්ෂයකට අධික කාලයක් ගතවී ඇතත් සමාගමේ මෙහෙයුම් හා අභ්‍යන්තර පාලන කටයුතුවල කාර්යාක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහළ නැංවෙන ආකාරයට එහි ආංශික පිරිසැලැස්ම (Division Layout) සකස්කර නොතිබු අතර නව සමාගමේ කටයුතු පැරණි සමාගම් දෙකෙහි ගොඩනැගිලි තුළ විවිධ ස්ථානවල වෙන් වෙන්ව පවත්වාගෙන යන බවට නිරීක්ෂණය විය.කෙසේවෙතත් සමාගම ඒකාබද්ධකර සියලු අංශ සැලසුම් සහගත ලෙස එක් ගොඩනැගිල්ලක් තුළ පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් ස්ථිර හා ඵලදායී තීරණයක් ගැනීමට ඉහළ කළමණාකාරීත්වය මේවන තෙක් කටයුතු කර නොතිබුණි. | ප්‍රධාන කාර්යාලය පිහිටි ලංකා පොහොර සමාගම වසර 20කට අධික කාලයක් නිසි නඩත්තුවක් කර නොමැති අතර මේ හේතුවෙන් ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල නිසි ලෙස නඩත්තු හා නවීකරණය කිරීමේ අවශ්‍යතාවය මතු වූ බැවින් හා වර්තමාන කාර්ය මණ්ඩලයට සුදුසු ලෙස සියළු අංශයන් ප්‍රතිනිර්මාණය කිරීමට සිදුවිය. ප්‍රසම්පාදනය හරහා එම කටයුතු අවසන් වන තෙක් මෙහෙයුම් කටයුතු සඳහා බාධාකාරී නොවන ලෙස පැරණි සමාගම් ගොඩනැගිල්ල තුලම මූල්‍ය හා අලෙවි අංශ පවත්වාගෙන යන ලදී .<br>ඒ අනුව කාර්ය මණ්ඩල ක්‍රමානුකූලව ප්‍රධාන කාර්යාලය තුළ ස්ථානගත කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර දෙසැම්බර් මස වන විට සියළු අංශයන් එක් ගොඩනැගිල්ලක් තුළ ස්ථානගත කිරීමට නියමිතව ඇත. සියළු කටයුතු එදිනෙදා මෙහෙයුම් කටයුතු වලට බාධාවක් නොවන ලෙස කරගෙන යාම හේතුවෙන් යම් ප්‍රමාදයක් සිදු වී ඇත. | ආංශික පිරිසැලැස්ම සැලසුම්කර සමාගමේ වත්කම් පූර්ණ උපයෝජනය කළ යුතුය. |

## 3.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම ඒකාබද්ධ කිරීමෙන් පසු 2024 ජුනි 30 සිට 2025 මාර්තු 31 දක්වා මාස 09 ක කාලපරිච්ඡේදය තුළ හුණුපිටිය ප්‍රධාන කාර්යාලය මඟින් සිදුකරන ලද විකුණුම් වලින් සියයට 61 ක ප්‍රතිශතයක් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, පොල් වගා කිරීමේ මණ්ඩලය හා ගොවිජන සේවා මධ්‍යස්ථාන සමඟ සහනාධාර මිල ගණන් යටතේ හෝ ණය පදනම මත පොහොර සැපයීම සඳහා ඇතිකරගත් ගිවිසුම්වලට අදාළව සිදුකරන ලද විකුණුම් වන අතර නව සමාගම විසින් සෘජුව සිදුකරන ලද විකුණුම් සියයට 39 ක් වැනි අඩු ප්‍රතිශතයක් ගෙන තිබූ බව විගණනයට නිරීක්ෂණය විය. | වසර ගණනාවක සිට රාජ්‍ය පොහොර සමාගම් සෘජු සහනාධාර පොහොර වී වගාව සඳහා බෙදාහැරීම ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා සිදු කළ අතර පෞද්ගලික සමාගම් සෘජු හා මිශ්‍රණ පොහොර අලෙවි නියෝජිතයන් හරහා බෙදාහැරීම සිදු කරන ලදී.<br>රාජ්‍ය සමාගමක් ලෙස මූල්‍ය රෙගුලාසි වලට අවනත විය යුතු බැවින් ඉහත පරිදි ආකර්ශනීය වැඩසටහන් ක්‍රියාත්මක කළ නොහැකි වීම හේතුවෙන් පෞද්ගලික අංශය හරහා අලෙවිය අඩු වී ඇත .තවද පොහොර ප්‍රසම්පාදනයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව පොහොර ප්‍රසම්පාදනය කල යුතු බැවින් පෞද්ගලික අංශයට වඩා ඉහළ මිලක් රාජ්‍ය පොහොර සමාගම සඳහා සැපයුම්කරුවන් ඉදිරිපත් කරයි .ඒ හේතුවෙන් අප සමාගම හට ආකර්ශනීය වෙළඳ වට්ටම් අලෙවි නියෝජිතයන් හට ලබා දීමට නොහැකි වීමද සෘජු පොහොර අලෙවිය පහළ යාමට හේතු වී ඇත. | සමාගම සිය අලෙවි ඉලක්ක සපුරා ගැනීම සඳහා උපායමාර්ගිකව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024/2025 මූල්‍ය වර්ෂයේ මාස 08 ක කාලච්ඡේදයක් සඳහා අනුමත කරන ලද අයවැය ඇස්මේන්තුව තුළ එම කාලච්ඡේදයේ විකුණුම් පරිමාව පොහොර මෙ.ටොන් 54,000 ක් ලෙස ඇස්මේන්තුකර තිබුණද, එම කාලච්ඡේදයට අදාළ සත්‍ය විකුණුම් පරිමාව පොහොර මෙ.ටොන් 21,907 ක් විය. කෙසේ වෙතත් එම අයවැය තුළ විකුණුම් ප්‍රවර්ධනය වෙනුවෙන් රු.42,900,000 ක් ඇස්තුමේන්තු කර තිබුණද නව සමාගම ස්ථාපනය කිරීමේදී එම සමාගම ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් රු.මිලියන 41 කට ආසන්නව දරන ලද වියදම් හැරුණුකොට, විකුණුම් ප්‍රවර්ධන කටයුතු සිදුකර නොතිබුණි. මෙම සමාගම විසින් විකුණුම් කොමිස් ලෙස රු.11,770,210 ක වියදමක් දරා තිබුණද එම කොමිස් මුදල් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සමඟ ඇතිකරගත් ගිවිසුමකට අනුව සිදුකරගෙන යනු ලබන තේ පොහොර අලෙවි කිරීම වෙනුවෙන් දරන ලද වියදමක් බව නිරීක්ෂණය විය. | මෙ.ටොන් 20,000ක යූරියා පොහොර ප්‍රසම්පාදනය සඳහා තෝරාගත් සැපයුම්කරු හට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අවශ්‍යතා සපුරාලීමට නොහැකි වීම හේතුවෙන් 2024/25 මූල්‍ය වර්ෂය තුළ අපේක්ෂිත විකුණුම් ඉලක්කය වෙත ළඟා වීමට නොහැකිවිය. ඒ අනුව ඇති වූ පොහොර හිඟය, අලෙවිය සීමා කිරීමට හේතු වී ඇත.<br>නව සමාගම ස්ථාපනය කිරීමේදී මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය හරහා පුළුල් ප්‍රචාරණයක් ලබා දුන් අතර එය සෘජුවම අලෙවිය වර්ධනයට බලපාන බව දන්වා සිටිනු කැමැත්තෙමි. ඒ අනුව සමාගම ප්‍රවර්ධනයේදී එම සන්නාමය යටතේ පවතින පොහොර ද සෘජුවම ප්‍රවර්ධනය වන බව දන්වා සිටිනු කැමැත්තෙමි.<br>විගණන විමසුම මඟින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සමඟ ඇති කර ගත් ගිවිසුම අනුව ගෙවනු ලබන මෙහෙයුම් වියදම කොමිස් මුදලක් ලෙස පෙන්වා දී ඇති අතර එය මෙහෙයුම් වියදම් සඳහා ගෙවනු ලබන ගෙවීමක් ලෙස නිවැරදි විය යුතු බව දන්වනු කැමැත්තෙමි. | සමාගම තම අයවැයගත ඉලක්ක සපුරා ගැනීම සඳහා උපායමාර්ගිකව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නව සමාගම වෙනුවෙන් නිර්මාණය කරන ලද web අඩවිය හා Facebook පිටුව එම සමාගම ආරම්භකළ 2024 ජූලි මාසයේ සිට යාවත්කාලීන කර නොතිබුණු අතර වර්තමානය වන විට විකුණුම් ප්‍රවර්ධන කටයුතු සඳහා සමාජ මාධ්‍ය වැඩි වශයෙන් භාවිතා වන පසුබිමක අවම පිරිවැයක් යටතේ Website, Facebook Page හා You tube වැනි සමාජ මාධ්‍ය හරහා සිදුකළ හැකි ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් අවධානය යොමුකරමින් අලෙවි අංශය වඩාත් සක්‍රිය කිරීමට ඉහළ කළමණාකාරීත්වයේ අවධානය යොමුවී නොතිබුණි. | ඒකාබද්ධ කර ස්ථාපිත ස්ටේට් ෆර්ටිලයිසර් නමින් නව වෙබ් අඩවියක්, සකස් කර ගැනීම සඳහා ටෙන්ඩර් ක්‍රමවේදය හරහා රාජ්‍ය ආයතනයක් වන සැලසිනේ ආයතනය තෝරා ගන්නා ලදී. එහිදී ඔවුන් විසින් නිර්මාණය කරන ලද නව වෙබ් අඩවිය 2025 ජුනි මස වන තෙක්ම අපගේ පිරිවිතරයන්ට අනුකූලව යාවත්කාලීන කරමින් පැවති නමුත්, එම කටයුතු ද හදිසියේ අක්‍රිය විය.<br>මේ පිළිබඳව අවස්ථා කිහිපයකදීම සැලසිනේ ආයතනය සමඟ රැස්වීම් වට කිහිපයක්ම පවත්වා සාකච්ඡා කල නමුත්, එය සාර්ථක නොවූ බැවින්, අප සමාගමේ නිළ වෙබ් අඩවිය පිහිටුවීම සම්බන්ධව කෘෂිකර්ම අමාත්‍යාංශයේ තාක්ෂණ අංශයේ සහකාර අධ්‍යක්ෂතුමිය සමඟ සාකච්ඡා කරන ලද අතර, එහිදී ලබාදුන් උපදෙස් පරිදි ආයතනික ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ සුදුසු ආයතනයක් තෝරා ගෙන නව වෙබ් අඩවියක් නිර්මාණය කර ගැනීමට සහ you tube චැනලයක් නිර්මාණය කර පවත්වා ගැනීමට අදාල පිරිවිතරයන් සකසා ප්‍රසම්පාදන ක්‍රියාවලිය මේ වනවිට ආරම්භ කර ඇත. එසේම Face book පිටුව මේ වන විට ක්‍රියාකාරී තත්වයේ පවතින බව සඳහන් කරනු කැමැත්තෙමි. | අන්තර්ජාලය මගින් විකුණුම් ප්‍රවර්ධන කටයුතු සිදුකර විකුණුම් ඉලක්කයන් සපුරාගත යුතුය. |

## 3.6 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිවාඩු නිකේතනයක් ඉදිකිරීම සඳහා සී/ස ලංකා පොහොර සමාගම විසින් 2011 වර්ෂයේ දී කතරගම ප්‍රාදේශිය ලේකම් වෙතින් ඉල්ලුම් කර ලබා ගෙන ඇති කඳසුරිදුගම ග්‍රාම නිළධාරි වසමේ "කතරගම කැලය" නම් ඉඩමට අයත් හෙක්ටයාර 0.2024 ප්‍රමාණයෙන් යුත් ඉඩම සමාගම වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමට හෝ නැවත කතරගම ප්‍රාදේශිය ලේකම් වෙත නීත්‍යානුකූලව භාරදී නොතිබුණි. | නිවාඩු නිකේතනයක් ඉදිකිරීම සඳහා සී/ස ලංකා පොහොර සමාගම වෙත භාර දෙන ලද කතරගම කඳසුරිදුගම ග්‍රාමයේ අක්කර ½ ඉඩම කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, "කඳසුරිදුගම" ග්‍රාම නිළධාරි වසමේ, "කතරගම කැලය" නම් ඉඩමට අයත් හෙක්ටයාර 0.2024ක ප්‍රමාණයකින් යුත් ඉඩම් කොටස සංචාරක නිවාඩු නිකේතනයක් ඉදිකිරීම සඳහා කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් ඉල්ලුම් කර ලබාගෙන ඇති නමුත් මෙම ඉඩම් කොටසට ඇති මාර්ගයේ පවතින ගැටළු හේතුවෙන් සංචාරක නිවාසයක් ඉදිකිරීම සඳහා සුදුසු නොවන බවටත් ,එම කටයුතු අත්හිටුවීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කිරීමෙන් පසු කතරගම ප්‍රාදේශීය ලේකම් වෙත ඉඩම විධිමත් පරිදි බාරගන්නා ලෙස ලිඛිතව දැන්වීමට කටයුතු කර ඇත. | අදාළ ඉඩම නීත්‍යානුකූලව පැවරීමේ කටයුතු සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වයඹ පලාතේ,පුත්තලම දිස්ත්‍රික්කයේ කරුවලගස්වැව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පහල පුලියන්කුලම ග්‍රාම සේවක කොට්ඨාසයේ අංක 638 ග්‍රාම නිළධාරී වසමේ නීලබැම්ම ව්‍යාපාරය යටතේ අංක LB25-7A දරන අක්කර 25 ක භූමි ප්‍රමාණයෙන් යුත් නීලබැම්ම ව්‍යාපාරය යටතේ වෙන් කරන ලද ඉඩම මෙතෙක් මෙම සමාගම වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමට හෝ නිත්‍යානුකූලව කරුවලගස්වැව ප්‍රාදේශිය ලේකම් වෙත ආපසු භාර දී නොතිබුණි. | නීලබැම්ම ව්‍යාපාරය යටතේ සී/ස ලංකා පොහොර සමාගම සඳහා වෙන් කරන ලද අංක LB25-7A දරණ අක්කර 25 ඉඩම වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ,කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පහල පුලියන්කුලම ග්‍රාමසේවක කොට්ඨාශයේ, අංක.638 ග්‍රාම නිළධාරි වසමේ නීලබැම්ම ව්‍යාපාරය යටතේ අංක LB25-7A දරණ ඉඩම් කොටස සීමාසහිත ලංකා පොහොර සමාගම වෙත වෙන්කර තිබූ අතර මෙම ඉඩම් කොටස නිත්‍යානුකූලව පැවරීමක් සිදු කර නොමැති බැවින් මෙම ඉඩම් කොටස සංවර්ධනය කිරීම සුදුසු නොවන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කිරීමෙන් පසු මෙම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයෙන් පසු මෙම ඉඩම ආපසු බාර ගන්නා ලෙස කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් වෙත ලිඛිතව දැනුවත් කර ඇති අතර මෙම ඉඩම භාරගත් බවට අප සමාගම වෙත යොමු කර ඇත. | අදාළ ඉඩම නිත්‍යානුකූලව පැවරීමේ කටයුතු සිදුකළ යුතුය. |

**3.7 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නව සමාගම වෙනුවෙන් අනුමත සේවක සංඛ්‍යාව 181 ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 161ක් විය. පැවති සමාගම් දෙකෙහි 438 දෙනෙකු සේවය කර තිබූ බැවින් පෙරදී භාවිතා කළ ස්ථාවර වත්කම්, පරිගණක, ඒ ආශ්‍රිත උපකරණ අතිරික්තය සම්බන්ධයෙන් නව සමාගම ස්ථාපිත කර වසරකට අධික කාලයක් ඉක්මවා ගොස් තිබුණද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් මෙම වාර්තාවේ දින වන විට එම වත්කම් ඌන උපයෝජිතව හා නිෂ්කාර්යව විවිධ ස්ථානවල අනාරක්ෂිතව පැවතුණු අතර එම වත්කම් සත්‍යාපනය සිදුකර වත්කම්හි භෞතික පැවැත්ම තහවුරු කිරීමටත් එම වත්කම් ඵලදායී කාර්යයකට යෙදවීමට හෝ කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් සත්‍යාපන කටයුතු සිදු කිරිම සඳහා ප්‍රමාණවත් සේවක පිරිසක් නොමැති බැවින් 2025 ජනවාරි 21 දින අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ප්‍රකාරව ඒ සඳහා ස්වාධීන ආයතනයක් ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව තෝරා ගැනීමේදී දෙවනුව සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද ලංසුකරු වන E&Y ආයතනය තෝරා පත්කර ගන්නා ලදී. මේ වන විට එම ආයතනය සමඟ ඒකාබද්ධව අදාළ ස්ථාවර වත්කම් සත්‍යාපන කටයුතු සිදු කරන අතර, එසේම ආයතනය සතුව පැවැති අතිරික්ත වාහන ප්‍රසම්පාදන ක්‍රමවේදයන් යටතේ මේ වන විටත් බැහැර කිරීම සිදුකර ඇත. තවද , ප්‍රාදේශීය ගබඩා සතුව පැවති ස්ථාවර වත්කම්ද පොළොන්නරුව හා හුණුපිටිය ගබඩා වල ආරක්ෂිතව ගබඩා කර ඇති අතර සත්‍යාපනයෙන් පසු අපහරණය සඳහා සූදානම් කරනු ලැබේ . | වත්කම් සත්‍යාපන කටයුතු සිදුකර වත්කම් පූර්ණ ලෙස උපයෝජනය කළ යුතුය. |

## 3.8 මානව සම්පත් කළමණාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නව සමාගම සඳහා අනුමත සේවක සංඛ්‍යාව 181ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 161 ක් විය. තනතුරු 20 ක පුරප්පාඩු පැවති අතර ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 10 ක්, තෘතියික මට්ටමේ තනතුරු 05 ක්, ද්විතියික මට්ටමේ තනතුරු 01 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 04 ක් පවතින බව නිරීක්ෂණය විය.කෙසේ වෙතත් නව සමාගමට අදාළව බඳවා ගැනීමේ පටිපාටියක් විගණිත දිනය වන විටත් අනුමත වී නොතිබුණු අතර ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 1.4 ඡේදය ප්‍රකාරව හා උක්ත ලිපියේ සඳහන් පරිදි ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ හා කළමණාකරණ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය රහිතව අනුමත තනතුරු නාමයන්ගෙන් පරිබාහිර වෙනත් තනතුරු නාම භාවිතා නොකළ යුතු වුවත්, ආයතන සංග්‍රහයේ හා කළමණාකරණ සේවා දෙපාර්තුමේන්තුවේ විධිවිධාන වලින් බැහැරව විගණන දින වන විටත් නව සමාගමේ සේවක මණ්ඩලය විසින් පැරණි සමාගම්වල භාවිතාකරන ලද තනතුරු නාම භාවිතා කරමින් සේවයේ යෙදෙන බව නිරීක්ෂණය විය. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1877 VOL – L දරණ 2024 දෙසැම්බර් 31 දිනැති ලිපිය මඟින් නව සමාගම සඳහා සේවක හවතුන් 181 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් අනුමතකර ඇත.<br>ඉහත කී ලිපියේ උපදෙස් පරිදි අප සමාගම වෙත අනුමතකර ඇති තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටිය සකස්කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමතකර ගැනීමෙන් අනතුරුව විධිමත් පරිදි අනුමත තනතුරු සඳහා අනුයුක්ත කිරීම සිදුකල යුතු වූ බැවින්, එම තනතුරු සඳහා සකස් කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශ සහිතව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සඳහා 2025 අප්‍රේල් 30 දිනැතිව යොමුකර ඇත. එහෙත් මේ දක්වා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොමැත. බඳවා ගැනීමේ පරිපාටිය සඳහා අනුමැතිය ලැබීමෙන් පසු නව කාර්යා මණ්ඩල සංයුතියට අදාල තනතුරු සඳහා සේවක හවතුන් අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කල හැකිය. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද බඳවා ගැනීමේ පටිපාටිය ප්‍රකාරව නව කාර්ය මණ්ඩල සංයුතියට අදාල තනතුරු සඳහා සේවකයින් අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 35 වන ඡේදය ප්‍රකාරව, කෙටි නිවාඩු අනුමත කළ හැක්කේ වරකට පැය 1½ කාලයක් නොඉක්මවන පරිදි මසකට දෙවරක් වුවද, සමාගමේ සේවකයන් විසින් වරකට පැය ½ බැගින් මසකට කෙටි නිවාඩු 06 ක් ලබාගෙන තිබුණි. මෙසේ කෙටි නිවාඩු ලබා ගැනීමේ ප්‍රතිපාදන 2025 පෙබරවාරි 25 වන දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ප්‍රකාරව සමාගම විසින් සකස් කර ගන්නා ලද සේවක මණ්ඩල කාර්යය පටිපාටියට ඇතුළත් කර ඇති අතර එම කාර්යය පටිපාටි සංග්‍රහය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවේ අනුමැතිය මෙතෙක් ලැබී නොමැති බවත් මෙසේ කෙටි නිවාඩු ලබා ගැනීම මීට පෙර වර්ෂවල සිට | එවකට සීමාසහිත ලංකා පොහොර සමාගමේ ප්‍රධාන කාර්යාලය කොළඹ 01, වැතැම් වීදියේ පිහිටා තිබූ අතර එම කාර්යාලය 2002 වසරේ හුණුපිටිය මධ්‍යම ගබඩා සංකීර්ණ භූමියේ පිහිටි කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත කර ඇත. ඒ අනුව ප්‍රධාන කාර්යාලයේ සේවය කළ බහුතරයක් සේවක හවතුන් කොළඹ සිට හුණුපිටිය දක්වා දුම්රිය මගින් ප්‍රවාහන පහසුකම් සපයාගෙන ඇත. එසේම කොළඹ සිට හුණුපිටිය දක්වා ප්‍රවාහන පහසුකම් සීමිත වූ බැවින් හා නිරන්තර ප්‍රමාද වීම් හේතුවෙන් සේවයට වාර්තා කිරීමේදී ඇති වූ ප්‍රමාද වීම් ආවරණය කර ගැනීම සඳහා පැය 1 ½ , බැගින් වූ කෙටි නිවාඩු දෙක, පැය ½ හෝ පැය 01ක් ලෙස අත්‍යාවශ්‍යතාවය අනුව ලබා ගැනීමට අවස්ථාව ලබා දී ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව හෝ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද ආයතනික කාර්ය පටිපාටි සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සේවකයන් විසින් කිසිදු නිතිමය ප්‍රතිපාදනයකින් තොරව ලබාගෙන ඇති බවත් නිරීක්ෂණය විය. | එසේම රාජ්‍ය පොහොර සමාගම් දෙක ඒකාබද්ධ කර පිහිටුවන ලද නව සමාගමට අනුයුක්ත කරන ලද සේවක හවතුන් වෙතද දීර්ඝ කාලයක් භුක්ති විදින ලද වරප්‍රසාද අහිමි නොකිරීමේ පදනම මත, සේවක හවතුන් අභිප්‍රේරණය කිරීම සඳහා මූල්‍යමය නොවන වරප්‍රසාදයක් ලෙස සලකා කෙටි නිවාඩු ලබා ගැනීමේ ක්‍රම වේදය තව දුරටත් ක්‍රියාත්මකව ඇති අතර මසකට පැය03 ක උපරිම සීමාව ඉක්මවා කෙටි නිවාඩු ලබා දී නොමැත.<br>තවද, සමාගමේ ආයතනික කාර්ය පටිපාටි සංග්‍රහයටද ඇතුළත් කර එම කාර්ය පටිපාටිය අනුමැතිය සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ නිර්දේශ සහිතව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත 2025.04.07 දිනැතිව අනුමැතිය සඳහා යොමු කර ඇති අතර මේ වන තෙක් ඒ සඳහා අනුමැතිය ලබා දී නොමැත. එසේම සී/ස ලංකා පොහොර සමාගමේ 2024.11.01 දින සිට ක්‍රියාත්මකව පැවති සේවක මණ්ඩල කාර්ය පටිපාටියේද මෙම විධිවිධාන ඇතුළත්ව ඇත. | |

## 4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 01/2021 මඟින් ඉදිරිපත්කර ඇති රජය සතු ව්‍යාපාර සඳහා වන ආයතනික පාලන මාර්ගෝපදේශයට අනුව, සමාගමේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය ලේඛනය ඇතුළත්ව වර්ෂ 05 ක කාලයක් සඳහා පිළියෙල කරන ලද සමාගමේ උපාය මාර්ගික සැලැස්ම අදාළ අමාත්‍යාංශයේ ලේකම් මඟින් භාණ්ඩාගාර ලේකම් වෙත හෝ ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, රජය සතු එකම පොහොර සමාගම ලෙස ස්ථාපනය කරන ලද ඒකාබද්ධිත නව සමාගමට අදාළව සකස්කරන ලද උපායමාර්ගික සැලැස්මක් ඉහත පරිදි ඉදිරිපත්කළ බවට ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. කෙසේ වෙතත් නව සමාගමට අදාළ සංයුක්ත උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීමේ කාර්යය රු.4,950,000 කට බාහිර පාර්ශවයකට පවරා දී තිබුණු අතර ඉන් සියයට 60 ක ප්‍රමාණයක් එනම් රු.2,970,000 ක මුදලක් 2025 ජනවාරි 31 දින ගෙවා තිබුණි. | ඒකාබද්ධිත සමාගමෙහි වර්ෂ 05ක් සඳහා උපායමාර්ගික සැලැස්ම සටහන් කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ කොන්ත්‍රාත්කරු තෝරාගත් අතර ඔහු විසින් ඒ පිළිබඳව කරන ලද සංයුක්ත සැලැස්ම සමාගම් ඒකාබද්ධ කිරීම සඳහා පිහිටුවන ලද කමිටුවෙහි මුදල් අමාත්‍යාංශ නිළධාරියෙකුගේද සහභාගිත්වයෙන් සාකච්ඡා කරන ලද අතර වැඩිදුර අධ්‍යනය සඳහා ඔහු විසින් මහා භාන්ඩාගාරය වෙත යොමු කරන ලදී. එම සාකච්ඡාවේදී සංයුක්ත සැලැස්මෙහි නිරීක්ෂණය කරන ලද අඩුපාඩු නැවත සකස් කර දෙන මෙන් අදාළ කොන්ත්‍රාත්කරු වෙත උපදෙස් දුන් අතර එතෙක් එකඟ වූ මුදලින් ප්‍රතිශතයක් ලබාදෙන ලදී. | නව සමාගමට අදාළ සංයුක්ත උපායමාර්ගික සැලැස්ම විධිමත් පරිදි සකස් කර ඉදිරිපත් කළ යුතුය. |

## 4.2 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතෙහි ඡේද අංක 6.6 පරිදි මූල්‍ය වර්ෂය අවසන් වී මාස 05 ක් ඇතුළත සමාගමේ මූල්‍ය ප්‍රකාශන හා විගණන වාර්තාව ඇතුළත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සාභාගත කළයුතු වුවත්, 2024/2025 මූල්‍ය වර්ෂය අවසන් වී මාස 08 ක කාලයක් ගත වී ඇතත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි. | ඒකාබද්ධිත සමාගම සඳහා නව මෘදුකාංග පද්ධතියක් හඳුන්වා දුන් අතර එම පද්ධතිය සඳහා දත්ත ඇතුලත් කිරිමේ යම් ප්‍රමාදයක් සිදුවිය. මේ වන විට අවසාන අදියරෙහි ගිණුම් පිළියෙල කිරිම සිදුවන අතර කඩිනමින් එම කටයුතු අවසන් කර විගණනය සඳහා ලබාදිමට කටයුතු කරනු ලැබේ. ඉන් පසු ඉතා කඩිනමින් වාර්ෂික වාර්තාව පිළියෙල කර අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා යොමු කරනු ලැබේ. | නියමිත කාලපරිච්ඡේදය තුළ වාර්ෂික වාර්තාව පිළියෙල කර පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |